www.agaram.lk

AL/2017/45/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය I<br>பௌத்த நாகரிகம் I<br>Buddhist Civilization I | 45 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** උත්තරය තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** වෛදික සාහිත්‍යාගත නිර්මාණවාදී සංකල්පයට ඇතුළත් **නොවන** කුල නාම දෙකකි
(1) ශාක්‍ය හා බ්‍රාහ්මණ. (2) ශාක්‍ය හා ක්ෂත්‍රිය. (3) ශාක්‍ය හා වෛශ්‍ය.
(4) ශාක්‍ය හා ශුද්‍ර. (5) ශාක්‍ය හා කෝලිය.

**2.** බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ජන්මීය සාධක පදනම් කොට ගෙන මානව වර්ගයා උසස් පහත් ලෙස වර්ගීකරණය කිරීම විවේචනයට ලක් කොට මිනිසාගේ ශාරීරික සමානතා ගෙනහැර දක්වමින් බුදුරජාණන් වහන්සේ විසින් වාසෙට්ඨ සූත්‍රයෙහි ලා ඉදිරිපත්කොට ඇති සාධක,
(1) ආචාර විද්‍යාත්මක වේ. (2) ජීව විද්‍යාත්මක වේ.
(3) සමාජ විද්‍යාත්මක වේ. (4) පාරිසරික වේ.
(5) ඓතිහාසික වේ.

**3.** ස්වධර්ම සංකල්පයට අනුව බ්‍රාහ්මණ වර්ණය විසින් පමණක් ඉටු කළ යුතු ස්වධර්ම දෙකක් ලෙස හඳුනා ගත හැක්කේ,
(1) යාග කරවීම හා යාග කිරීමයි.
(2) යාග කරවීම හා දන් දීමයි.
(3) යාග කරවීම හා කෘෂි කර්මාන්තයයි.
(4) යාග කරවීම හා වේද අධ්‍යයනයයි.
(5) යාග කරවීම හා දන් පිළිගැනීමයි.

**4.** ආපද්ධර්මය පිළිබඳ බ්‍රාහ්මණ නිර්වචනයට අනුව **වැරදි** ප්‍රකාශය වන්නේ,
(1) 'බ්‍රාහ්මණයා විසින් ක්ෂත්‍රියයාට අයත් කාර්යයන් කළ හැකි ය' යන්නයි.
(2) 'බ්‍රාහ්මණයා විසින් වෛශ්‍යයාට අයත් කාර්යයන් කළ හැකි ය' යන්නයි.
(3) 'ක්ෂත්‍රියයා විසින් බ්‍රාහ්මණයාට අයත් කාර්යයන් කළ හැකි ය' යන්නයි.
(4) 'ක්ෂත්‍රියයා විසින් වෛශ්‍යයාට අයත් කාර්යයන් කළ හැකි ය' යන්නයි.
(5) 'වෛශ්‍යයා විසින් ශුද්‍රයාට අයත් කාර්යයන් කළ හැකි ය' යන්නයි.

**5.** බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව කාන්තාව වනාහි ආගමික, සාමාජික ආදී සියලු අයිතිවාසිකම් අහිමි, ලාමක පැවතුම් ඇති, තැනැත්තියක ලෙස හැඳින්වුව ද භාරතීය ඉතිහාසයේ ඇතැම් යුගවල දී ඇය පුරුෂයා මෙන් ම සියලු වරප්‍රසාද භුක්ති විඳි අයුරු ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වේ. තවද කාන්තාව සියලු සැප සම්පත් ලබා දෙන සෞභාග්‍යයේ සංකේතයක් ලෙස පිදුම් ලැබූ බව ද සාධක මගින් තහවුරු වේ. ඒ අනුව භාරතීය ඉතිහාසයේ කාන්තාව පූජනීයත්වයට පත්ව තිබූ බවට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,
(1) ප්‍රාග් වෛදික යුගයේ දී ය. (2) වේද මන්ත්‍ර යුගයේ දී ය.
(3) ආරණ්‍යක යුගයේ දී ය. (4) උපනිෂද් යුගයේ දී ය.
(5) වෛදික යුගයේ දී ය.

**6.** කිසිදු වෙනසක් කළ නොහැකි සදාතනික ආත්ම පදාර්ථයක් ඇතැයි ඉගැන්වූ ශාස්තෘවරයා වූයේ,
(1) පකුධ කච්චායනතුමන් ය. (2) අජිත කේසකම්බලීතුමන් ය.
(3) පූරණ කස්සපතුමන් ය. (4) මක්ඛලීගෝසාලතුමන් ය.
(5) නිගණ්ඨනාතපුත්තතුමන් ය.

[දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



7. දේවනිර්මාණවාදය ප්‍රතික්ෂේප කිරීමට ශ්‍රමණ සංස්කෘතිය විසින් හඳුන්වා දෙන ලද ප්‍රධාන ඉගැන්වීමක් ලෙස සැලකිය හැක්කේ,
(1) ඊශ්වර නිර්මාණවාදයයි. (2) අනීශ්වරවාදයයි.
(3) නිත්‍යාත්මවාදයයි. (4) බ්‍රහ්මන්-ආත්මන් ඒකත්වයයි.
(5) අමරාවික්ෂේපවාදයයි.

8. කර්මය පිළිබඳ ඉගැන්වීම බුදුසමයේ මෙන් ම ජෛන සමයේ ද මූලික සිද්ධාන්තයකි. මෙහිලා පහත සඳහන් ප්‍රකාශ අතුරින් බුදුසමයට වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) 'පෙර කරන ලද කර්මයෙන් සියල්ල සිදු වේ' යන්නයි.
(2) 'පෙර කරන ලද කර්මයෙන් කිසිවක් සිදු නොවේ' යන්නයි.
(3) 'කර්ම බීජ සියල්ල ආත්මයෙහි බැඳී ගමන් කරයි' යන්නයි.
(4) 'කාය කර්මය වඩාත් ප්‍රමුඛ ය' යන්නයි.
(5) 'මනෝ කර්මය වඩාත් ප්‍රමුඛ ය' යන්නයි.

9. බුද්ධකාලීන භාරතයේ පැවැති සොළොස්මහා ජනපද අතුරින් රාජාණ්ඩු ගණයට අයත් **නොවූ** ජනපදය වන්නේ
(1) මගධ ජනපදයයි. (2) වජ්ජි ජනපදයයි.
(3) කෝසල ජනපදයයි. (4) අවන්ති ජනපදයයි.
(5) වත්ස ජනපදයයි.

10. ඊශ්වර නිර්මාණවාදය බැහැර කිරීමෙහිලා වඩාත් ගැළපෙන බෞද්ධ ඉගැන්වීම ලෙස හඳුනා ගත හැක්කේ,
(1) කර්මවාදයයි. (2) අනාත්මවාදයයි.
(3) හේතුඵලවාදයයි. (4) අධිච්චසමුප්පන්නවාදයයි.
(5) අනිත්‍ය පිළිබඳ සිද්ධාන්තයයි.

11. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන අග්ගඤ්ඤ සූත්‍රාගත විග්‍රහයට අනුව, පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් ම නිවැරදි ප්‍රකාශය වනුයේ, එය
(1) පාරිසරික සාධක කරණකොටගෙන සිදු වී ඇති බවයි.
(2) මනෝවිද්‍යාත්මක සාධක කරණකොටගෙන සිදු වී ඇති බවයි.
(3) මනෝවිද්‍යාත්මක හා පාරිසරික සාධක කරණකොටගෙන සිදු වී ඇති බවයි.
(4) සර්වබලධාරී දෙවියකුගේ බලපෑමකින් තොරව ඉබේ සිදු වී ඇති බවයි.
(5) පටිච්චසමුප්පාද මූලධර්මයට අනුව පාරිසරික හා මනෝවිද්‍යාත්මක සාධක පදනම් කොට ගෙන සිදු වී ඇති බවයි.

12. වෛදික සාහිත්‍යයට අනුව සත්ත්වයා හා ලෝකය සර්වබලධාරී දෙවියෙකු විසින් මවා පාලනය කරනු ඇතැයි පැරණි භාරතීයයෝ විශ්වාස කළ හ. මෙම විශ්වාසය හැඳින්විය හැක්කේ,
(1) නියතිවාදය ලෙස ය. (2) බහුදේවවාදය ලෙස ය.
(3) ඊශ්වර නිර්මාණවාදය ලෙස ය. (4) මූල හේතුවාදය ලෙස ය.
(5) නිත්‍යාත්මවාදය ලෙස ය.

13. ජනතාවගේ සිතුම් පැතුම් හා හැකියා හඳුනාගෙන කෘෂිකර්මාන්තයට උනන්දු වන අයට බිජුවට හා ආහාර ද වෙළඳාමට උනන්දු වන අයට ප්‍රාග්ධනය ද රාජ්‍ය සේවය රුචිවූවන්ට බත් වැටුප් ආදිය ද ලබා දීමට අනුබල දෙන බෞද්ධ දේශපාලන මූලධර්මය අන්තර්ගත වන්නේ,
(1) ජාතක පාළියේ ය. (2) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(3) මහා පරිනිබ්බාන සූත්‍රයේ ය. (4) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(5) කූටදන්ත සූත්‍රයේ ය.

14. සමාජ සදාචාරය හා සමාජයේ යහපැවැත්ම පිණිස බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබිය හැකි ආලෝකය ඉමහත් ය. දාන, සීල, භාවනා වශයෙන් මූලික ව ඉගැන්වෙන බෞද්ධ සාරධර්ම ආර්ය මාර්ගයෙහිලා සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිශික්ෂාවෙහි ඇතුළත් වේ. මේ අතර සමාජ සදාචාරය හා යහපැවැත්ම පිණිස අත්‍යවශ්‍ය බෞද්ධ සාරධර්මයක් ලෙස සැලකිය හැක්කේ,
(1) දානයයි. (2) සීලයයි. (3) භාවනාවයි.
(4) යෝනිසෝමනසිකාරයයි. (5) චිත්තේකාග්‍රතාවයි.

15. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසාවට අයත් යුතුකම් හා වගකීම්වල ඇතුළත් පවින් වැළැක්වීම
(1) මහණ බමුණන්ගේ හා දෙමව්පියන්ගේ යුතුකමකි.
(2) මහණ බමුණන්ගේ හා ගුරුවරුන්ගේ යුතුකමකි.
(3) මහණ බමුණන්ගේ හා සේවයාගේ යුතුකමකි.
(4) මහණ බමුණන්ගේ හා කල්‍යාණ මිතුරන්ගේ යුතුකමකි.
(5) මහණ බමුණන්ගේ හා ස්වාමි පුරුෂයන්ගේ යුතුකමකි.

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



16. රාජ්‍ය පාලනයෙහිලා වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීමටත්, ඔවුන්ගේ අවවාද අනුශාසනා ලබා ගැනීමටත් අවධානය යොමු කළ යුතු බව
(1) සතර සංග්‍රහ වස්තුවලින් අවධාරණය කෙරේ.
(2) සතර අගතිවලින් අවධාරණය කෙරේ.
(3) සප්ත අපරිහානීය ධර්මවලින් අවධාරණය කෙරේ.
(4) දසරාජධර්මවලින් අවධාරණය කෙරේ.
(5) දසසක්විතිවත්වලින් අවධාරණය කෙරේ.

17. "ධර්මය ම ඇසුරු කොට ධර්මයට ම සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මයට බුහුමන් කරමින්, ධර්මය ම පුදමින්, ධර්මයට යටත් පැවැත්ම දක්වමින්......ධර්මය ම අධිපති කොට ගෙන අන්තෝ ජනයා කෙරෙහි ද බල සෙනඟ කෙරෙහි ද අනුයුක්ත ක්ෂත්‍රියන් කෙරෙහි ද බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහි ද නියම්ගම් ජනපද වැසි ජනයා කෙරෙහි ද, මහණ බමුණන් කෙරෙහි ද මෘග පක්ෂීන් කෙරෙහි ද දැහැමි රැකවරණය සංවිධානය කරව."
ඉහත ඡේදයෙහි සක්විතිවත්,
(1) එකක් ඇතුළත් වේ.
(2) හතක් ඇතුළත් වේ.
(3) අටක් ඇතුළත් වේ.
(4) නවයක් ඇතුළත් වේ.
(5) දහය ම ඇතුළත් වේ.

18. නීතිගරුකත්වය හා සාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලට අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් ම නිවැරදි ලෙස සැලකිය හැකි ප්‍රකාශය වන්නේ,
(1) නීතිගරුකත්වය අපරිහානීය ධර්මයක් ලෙස බුදුසමයේ ඇගයීමට ලක් නොවන බවයි.
(2) බුදුසමය දඬුවම ප්‍රතික්ෂේප කරන බවයි.
(3) දඬුවම් දීම සමාජ සදාචාරය පිණිස අත්‍යවශ්‍ය සාධකයක් බවයි.
(4) වරදට පොලඹවන හේතු නැති කොට අපරාධ නැති කළ යුතු බවයි.
(5) සදාචාර සම්පන්න වීම මගින් ම සමාජ අපරාධ සියල්ල දුරු කළ යුතු බවයි.

19. බෞද්ධ ශ්‍රාවක සමාජය ආධ්‍යාත්මික සංවර්ධනය පදනම් කර ගනිමින් විවිධ වර්ගීකරණවලට ලක් කර තිබේ. ඒ අතුරින් ආර්ය ශ්‍රාවකයන් වර්ග කර ඇත්තේ,
(1) භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා වශයෙනි.
(2) සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහන්ත වශයෙනි.
(3) බුදු, පසේබුදු, මහරහත්, සක්විති රජ වශයෙනි.
(4) අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභානලාභීන් වශයෙනි.
(5) පඨම, දුතිය, තතිය, චතුත්ථ ධ්‍යානලාභීන් වශයෙනි.

20. සිත, කය, වචනය යන තිදොරින් සිදුවන සාවද්‍ය ක්‍රියා දහයක් ඇති බවත්, ඒවා දස අකුසල නමින් හැඳින්වෙන බවත්, බුදුදහමෙහි දැක්වේ. මෙම අකුසල දහය සිදු වන්නේ,
(1) කයින් තුනක් ද වචනයෙන් තුනක් ද මනසින් හතරක් ද වශයෙනි.
(2) කයින් හතරක් ද වචනයෙන් තුනක් ද මනසින් තුනක් ද වශයෙනි.
(3) කයින් තුනක් ද වචනයෙන් හතරක් ද මනසින් තුනක් ද වශයෙනි.
(4) කයින් හතරක් ද වචනයෙන් හතරක් ද මනසින් දෙකක් ද වශයෙනි.
(5) කයින් හතරක් ද වචනයෙන් දෙකක් ද මනසින් හතරක් ද වශයෙනි.

21. බෞද්ධ විග්‍රහයට අනුව සචේතනිකවූත්, ආචාරාත්මකවූත් හොඳ නරක පුද්ගල ක්‍රියා කිසියම් නිර්ණායකයක් පදනම් කොට ගෙන විනිශ්චය කරනු ලබයි. මෙහිලා එවැනි නිර්ණායකයක් ලෙස **නොසැලකිය හැකි** ධර්මපර්යාය වන්නේ,
(1) 'සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය ය' යන්නයි.
(2) 'විපාකය අමිහිරි නම් නොකළ යුතු ය' යන්නයි.
(3) 'තමා අධිපති කොට කල්පනා කළ යුතු ය' යන්නයි.
(4) 'තමන්, අනුන් හා උභය පක්ෂයට සිදුවන යහපත අයහපත සලකා බැලිය යුතු ය' යන්නයි.
(5) 'තම හෘද සාක්ෂියට අනුව තීරණය කළ යුතු ය' යන්නයි.

22. කණ්ඩායමක අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා දක්ෂ හා විචක්ෂණ ලෙස භෞතික හා මානව සම්පත් ඵලදායීව යොදා ගැනීම කළමනාකරණය ලෙස අර්ථ දැක්විය හැකි ය. බුදුසමය තුළ ද විධිමත් කළමනාකරණ ක්‍රමවේද භාවිත කර ඇති බව මූලාශ්‍රයාගත තොරතුරුවලින් අනාවරණය වේ. බුදුරදුන් අනුදත් සාංඝික දේපළ ක්‍රමය ද සාර්ථක කළමනාකරණ සිද්ධාන්තයක් ලෙස හඳුනාගත හැකි අතර එය,
(1) මානව සම්පත් කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.
(2) ආධ්‍යාත්මික කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.
(3) භෞතික සම්පත් කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.
(4) පිරිස් කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.
(5) පරිසර කළමනාකරණයට උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.

[හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



39352

23. බුදුරජාණන් වහන්සේ හා වීතරාගී භික්ෂු භික්ෂුණීන් ලොව සොඳුරු දැ වින්දනය කළ අයුරු බෞද්ධ මූලාශ්‍රවල දක්නට ලැබේ. සෞන්දර්ය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව මෙය,
(1) අනුපාදානාත්මක වින්දනයකි. (2) සෞන්දර්යාත්මක වින්දනයකි.
(3) උපාදානාත්මක වින්දනයකි. (4) ශෘංගාරාත්මක වින්දනයකි.
(5) සුඛවේදනාත්මක වින්දනයකි.

24. "ස්වාමීනි, මහා ප්‍රජාපති ගෝතමී භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාර කළා ය. ඇය කුඩා මෑණියෝ ය. නුඹ වහන්සේගේ අත් පා වඩා පෝෂණය කළ තැනැත්තී ය. කිරිදුන් තැනැත්තී ය. මව කළුරිය කළ කල්හි සිය තනයෙන් කිරි පෙව්වා ය. එහෙයින් කාන්තාව වෙත පැවිද්ද ලබා දෙන්නේ නම් යෙහෙකැයි" චුල්ලවග්ග පාළියේ එන ඉහත සඳහන් ප්‍රකාශය ආනන්ද හිමියන් විසින් සිදු කරන ලද්දේ මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු පිරිසට බුදුසසුනේ පැවිදි බව ලබා දීම පිණිස බුදුරදුන්ගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ දී ය. මෙම සිදුවීම සිදුවූයේ,
(1) සැවැත්නුවර ජේතවනාරාමයේ දී ය. (2) කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ දී ය.
(3) රජගහනුවර වේළුවනාරාමයේ දී ය. (4) විශාලා මහනුවර කූටාගාර ශාලාවේ දී ය.
(5) කපිලවස්තුපුර නිග්‍රෝධාරාමයේ දී ය.

25. එක් එක් අංශවල විශේෂ දක්ෂතා ඇති ශ්‍රාවකයන් හඳුනාගත් බුදුරජාණන් වහන්සේ ඔවුන් අග තනතුරුවලට පත් කළහ. මේ අනුව ධුතාංගධාරීන් අතුරින් අගතැන් පත්වූයේ,
(1) අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහතෙරුන් ය. (2) සාරිපුත්ත මහතෙරුන් ය.
(3) මොග්ගල්ලාන මහතෙරුන් ය. (4) චුල්ලපන්ථක මහතෙරුන් ය.
(5) මහා කාශ්‍යප මහතෙරුන් ය.

26. බොහෝ දෙවි මිනිසුන්ගේ පැසසුමට ලක් වූ බුදුරජාණන් වහන්සේ චිංචාමානවිකා, අක්‍රොශ පරිබ්‍රාජක වැන්නවුන්ගේ නින්දා අපහාසවලට ද ලක් වූහ. සැපයේ දී උද්දාමයටත් දුකේ දී කම්පාවටත් පත් නොවූ උන් වහන්සේ සියල්ල මැදහත් සිතින් විඳ දරා ගත්හ. මෙයින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේගේ,
(1) මහා කරුණාවයි. (2) අරහං ගුණයයි. (3) භගවා ගුණයයි.
(4) තාදී ගුණයයි. (5) උපේක්ෂාවයි.

27. ඒ ඒ දිශාවල හා ජනපදවල කුල දරුවන් පැවිදි උපසම්පදා කිරීමට භික්ෂු සංඝයාට බලය ලබා දීමත් සමඟ භාවිතයට පැමිණි උපසම්පදා ක්‍රමය හඳුන්වනු ලබන්නේ,
(1) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව නමිනි. (2) සරණාගමන උපසම්පදාව නමිනි.
(3) පඤ්හබ්‍යාකරණ උපසම්පදාව නමිනි. (4) දූතෙන උපසම්පදාව නමිනි.
(5) ඕවාද පටිග්ගහණ උපසම්පදාව නමිනි.

28. "මහණ මහලු පැවිද්ද" යනු
(1) සාමණේරභාවයට පත්වීමයි. (2) මහලු වියේ දී පැවිදි බිමට ඇතුළු වීමයි.
(3) අධිශීලයට හෙවත් උපසම්පදාවට පත්වීමයි. (4) මහලු වියේ දී උපසම්පදාවට පත්වීමයි.
(5) උපසම්පදා තත්ත්වයට පත් නොවී සිටීමයි.

29. "ස්ත්‍රියක සෙවීමට වඩා තමා ගැන සෙවීම උතුම් ය"යි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ,
(1) යසකුල පුත්‍රයාට ය. (2) යසකුල පුත්‍රයාගේ යහළුවන්ට ය.
(3) උපතිස්ස කෝලිත දෙදෙනාට ය. (4) භද්දවග්ගිය කුමාරවරුන්ට ය.
(5) නන්ද කුමාරයාට ය.

30. භික්ෂු සංඝයා කැමති නම්, ඛුද්දානුඛුද්දක ශික්ෂාපද වෙනස් කර ගන්න යැයි බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට ආසන්න සමයේ දී දේශනා කළ බව ආනන්ද හිමියෝ ප්‍රථම සංගීති අවස්ථාවේ දී සංඝයාට දැනුම් දුන්හ. ඒ පිළිබඳව සිදු කළ සාකච්ඡාවේ දී ඛුද්දානුඛුද්දක ශික්ෂා පද සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණය වූයේ,
(1) පාරාජිකා හැර අන් සියලු ශික්ෂාපද ඛුද්දානුඛුද්දක ශික්ෂා ගණයට අයත් වන බව ය.
(2) පාරාජිකා හා සංඝාදිසේස හැර අන් සියලු ශික්ෂාපද ඛුද්දානුඛුද්දක ශික්ෂා ගණයට අයත් වන බව ය.
(3) පාරාජිකා, සංඝාදිසේස හා අනියත හැර අන් සියලු ශික්ෂාපද ඛුද්දානුඛුද්දක ශික්ෂා ගණයට අයත් වන බව ය.
(4) කිසිදු ශික්ෂාපද කොටසක් ඛුද්දානුඛුද්දක වශයෙන් වෙන් නොකළ යුතු බව ය.
(5) ඛුද්දානුඛුද්දක ශික්ෂාපද පිළිබඳව බුදුරදුන්ගෙන් නොවිමසීම ආනන්ද හිමියන්ගේ වරදක් බව ය.

31. දේශීය හා විදේශීය සිසුන් විශාල සංඛ්‍යාවක් අධ්‍යාපනය ලැබූ නාලන්දා විශ්වවිද්‍යාලයේ දසදහසකට අධික සිසුන් සංඛ්‍යාවකට එක්වර නේවාසික පහසුකම් සැපයූ බව වාර්තාවලින් තහවුරු වේ. එසේ කිරීමට සිදු වූයේ,
(1) සියලු සිසුන් නේවාසික විය යුතු යැයි විශ්වවිද්‍යාලයේ නීතියක් ක්‍රියාත්මක වූ නිසා ය.
(2) ජනශූන්‍ය ප්‍රදේශයක විශ්වවිද්‍යාලය පිහිටීම නිසා ය.
(3) ප්‍රමාණවත් නේවාසික පහසුකම් විශ්වවිද්‍යාලය සතුව තිබීම නිසා ය.
(4) සියලු ම සිසුන් විදේශිකයන් වීම නිසා ය.
(5) වෙනත් නේවාසික විශ්වවිද්‍යාල මේ යුගයේ භාරතයේ නොතිබීම නිසා ය.

[පස්වෙනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**32.** දස අකැප වස්තුවට අයත් වූ 'ආචිණ්ණකප්ප' යන්නෙන් අදහස් වූයේ,
(1) කැප අකැප බවක් නොවිමසා ගුරු පරපුරින් පුහුණු කළ දේ පිළිගැනීම කැප බව ය.
(2) නොපැසුණු රා වැළඳීම කැප බව ය.
(3) කිරිත් නොවූ දීත් නොවූ කිරි වැළඳීම කැප බවයි.
(4) ඉරහැරී සෙවණැල්ල අඟල් දෙකක් දිග්වන තුරු දන් වැළඳීම කැප බව ය.
(5) එක් ගමක දී වරක් දන් වළඳා වෙනත් ගමකට ගොස් නැවත වරක් දන් වැළඳීම කැප බව ය.

**33.** තෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේලා පිටත් කර යැවිය යුතු යැයි තීරණය කරන ලද්දේ,
(1) මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගේ යෝජනාවකට අනුව ය.
(2) ධර්මාශෝක අධිරාජයාගේ ඉල්ලීමකට අනුව ය.
(3) මහා ධම්මරක්ඛිත හිමියන්ගේ ඉල්ලීමකට අනුව ය.
(4) සෝණ, උත්තර හිමිවරුන්ගේ ඉල්ලීමකට අනුව ය.
(5) මිහිඳු හිමියන්ගේ ඉල්ලීමකට අනුව ය.

**34.** සිරි සඟබෝ රජු වැරදිකරුවන්ට මරණ දඬුවම ලබා දෙන බව හැඟවීමට සොහොන් බිමෙන් රහසින් මළ සිරුරු ගෙන්වා මහජනයාට පෙනෙන තැනක එල්ලා තබා වැරදිකරුවන්ට අවවාද දී මුදා හැරියේ,
(1) ඒ යුගයේ ලංකාවේ මාඝාත ආඥාව ක්‍රියාත්මකව පැවැති නිසා ය.
(2) රජු පංචශීල ප්‍රතිපදාව මත පිහිටා පාලනය ගෙන ගිය නිසා ය.
(3) රජු රාජ්‍ය පාලනයේ දුර්වලයකු වූ නිසා ය.
(4) රජුගේ චර පුරුෂයන් කළ වැරදි සඟවා තබා ගැනීමට අවශ්‍ය වූ නිසා ය.
(5) දඬුවම් දීම බෞද්ධ ප්‍රතිපදාවට නොගැළපෙන නිසා ය.

**35.** මළවුන් ඇදහීමට නව අර්ථකථනයක් එක් කරමින් මිහිඳු හිමියන් විසින් සිදු කරන ලද දේශනාව වූයේ,
(1) චූල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාවයි.
(2) පෙතවත්ථු විමානවත්ථු දේශනාවයි.
(3) ආසිවිසෝපම සූත්‍ර දේශනාවයි.
(4) සච්චසංයුත්ත සූත්‍ර දේශනාවයි.
(5) ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවයි.

**36.** පණ්ඩුකාභය රජු චිත්තරාජ යක්ෂයාට අභය වැවේ පහළ ප්‍රදේශයේ වාසස්ථානයක් කරවා දී කෘතවේදීත්වය පළ කිරීමට ප්‍රමුඛතම හේතුව වූයේ,
(1) කුඩා කල රජුගේ ජීවිතය ආරක්ෂා කළ නිසා ය.
(2) රජුට යුද්ධය ජය ගැනීමට සහාය වූ නිසා ය.
(3) රජුගේ දාසයෙකු ලෙස සේවය කළ නිසා ය.
(4) රජුගේ පියාගේ ආරක්ෂකයකු වීම නිසා ය.
(5) රජුගේ මවගේ ආරක්ෂකයකු වීම නිසා ය.

**37.** වලගම්බා රජු විසින් ඉදිකොට පූජා කළ අභයගිරි විහාරය පිළිගත් තිස්ස තෙරුන් මහා විහාරයෙන් නෙරපා දැමීමට තීරණය කරන ලද්දේ, එම තෙරණුවන්
(1) මහා විහාරික භික්ෂූන්ගේ අවවාද නොපිළිගත් නිසා ය.
(2) දේශපාලනයට සම්බන්ධ වී සිටීම නිසා ය.
(3) විනය විරෝධීව කටයුතු කිරීම නිසා ය.
(4) වලගම්බා රජුට පක්ෂපාතීව ක්‍රියා කළ නිසා ය.
(5) මහා විහාරයට එරෙහිව ගොඩනැඟූ නව ආරාමයක් පිළිගැනීම නිසා ය.

**38.** මොන්කුත් රජතුමාගේ ක්‍රියා කලාපය නිසා ථායි සංඝ සමාජය මහා නිකාය හා ධම්ම යුත්තික නිකාය වශයෙන් දෙකඩ විය. මෙසේ එකම භික්ෂු සම්ප්‍රදාය දෙකඩ කිරීමෙන් රජු අපේක්ෂා කරන ලද්දේ,
(1) විනය නීති දැඩි ලෙස ආරක්ෂා කිරීමට පෙලඹවීමයි.
(2) ආරාමික පාලනය විධිමත් කිරීමයි.
(3) ආරාම සතු දේපළ ආරක්ෂා කිරීමට පෙලඹවීමයි.
(4) ගිහි-පැවිදි සම්බන්ධය වඩාත් තහවුරු කිරීමයි.
(5) භික්ෂූන්ගේ සමාජ කාර්යභාරය විධිමත් කිරීමයි.

**39.** ශ්‍රී ලංකාව හා බුරුමය අතර සංස්කෘතික සබඳතා වැඩි දියුණු වූ යුගයක් ලෙස පළමුවන විජයබා රාජ්‍ය සමය හඳුන්වා දිය හැකි ය. මෙකල ශාසනික වශයෙන් වැදගත් වූ ප්‍රධාන සිදුවීමක් වූයේ,
(1) බුරුමයෙන් භික්ෂූන් පිරිසක් ගෙන්වා ශාසන සංශෝධනයක් සිදු කිරීමයි.
(2) උත්තරජීව හා ඡප්පට තෙරවරුන් ලංකාවට පැමිණීමයි.
(3) බුරුමයේ සීහල සංඝ නිකාය ආරම්භ කිරීමයි.
(4) බුරුම භික්ෂූන් පිරිසක් උපසම්පදාව පිණිස ලංකාවට පැමිණීමයි.
(5) බුරුමයේ කල්‍යාණී සීමාව පිහිටුවීමයි.

[හයවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



40. බුරුම පාලකයන් අතුරින් රජ වීමට පෙර පැවිදි වී සිටියේ,
(1) ධම්මචේතිය රජතුමා ය. (2) කෙයංසිත්ථ රජතුමා ය. (3) අනව්රථ රජතුමා ය.
(4) මිං ඩොං මින් රජතුමා ය. (5) මොන්කුත් රජතුමා ය.

41. බුරුම දේශයට බුදුසමය හඳුන්වා දීම පිළිබඳව සඳහන් වන ශ්‍රී ලාංකේය මූලාශ්‍රයක් වන්නේ,
(1) මහා වංසයයි. (2) ථූප වංසයයි. (3) බෝධි වංසයයි.
(4) ධාතු වංසයයි. (5) අත්තනගලු වංසයයි.

42. ප්‍රාග් බෞද්ධ යුගයේ ජපානය තුළ පැවති ආගමික විශ්වාසය ලෙස සැලකෙන්නේ,
(1) නාත් වන්දනාවයි. (2) කොන්ෆියුසියස් දහමයි. (3) ෂින්තෝ දහමයි.
(4) තාඕ දහමයි. (5) බොන් දහමයි.

43. මිංති අධිරාජ්‍ය සමයේ දී චීන දේශයට බුදුදහම හඳුන්වා දීමට මූලිකව ක්‍රියා කළ ධර්මදූතයන් වහන්සේලා දෙනම වූයේ,
(1) කාශ්‍යප මාතංග හා ධර්මරක්ෂ හිමිවරුන් ය.
(2) ෆාහියන් හා හියුංසාං හිමිවරුන් ය.
(3) බෝධිධර්ම හා ශාන්තරක්ෂිත හිමිවරුන් ය.
(4) සෝණ හා උත්තර හිමිවරුන් ය.
(5) කුමාරජීව හා පද්මසම්භව හිමිවරුන් ය.

44. ජපන් බුදුසමයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ ෂෝතොකුතයිෂි හෙවත් උමයදෝ කුමරුන්ගේ පාලන සමයයි. බුදුසමයේ සංවර්ධනය උදෙසා එතුමා හඳුන්වා දුන් නව ව්‍යවස්ථාවේ ඇතුළත් වගන්ති සංඛ්‍යාව වූයේ,
(1) දොළොසකි. (2) දහහතරකි. (3) සොළොසකි. (4) දහහතකි. (5) විස්සකි.

45. පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව මුල්වරට බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කරන ලද සම්ප්‍රදාය ලෙස සලකනු ලබන්නේ,
(1) මථුරා සම්ප්‍රදායයි. (2) ගන්ධාර සම්ප්‍රදායයි. (3) අමරාවතී සම්ප්‍රදායයි.
(4) පල්ලව සම්ප්‍රදායයි. (5) ගුප්ත සම්ප්‍රදායයි.

46. ලක්දිව හිඳි පිළිමවල වඩාත් ප්‍රකට මුද්‍රා ලක්ෂණය වන්නේ,
(1) විතර්ක මුද්‍රාවයි. (2) වරද මුද්‍රාවයි. (3) භූමි ස්පර්ශ මුද්‍රාවයි.
(4) ධර්මචක්‍ර මුද්‍රාවයි. (5) ධ්‍යාන මුද්‍රාවයි.

47. බුද්ධ ප්‍රතිමාව මානව රූපාකාරව නිර්මාණය කිරීමට පෙර බුදුරදුන් වෙනුවට විවිධ සංකේත භාවිත කොට තිබේ. ඒ සඳහා භාවිත **නොකළ** සංකේතයක් වන්නේ,
(1) ඌර්ණරෝම ධාතුවයි. (2) සිරිපතුලයි. (3) ධර්ම චක්‍රයයි.
(4) ආසනයයි. (5) බෝධියයි.

48. ස්තූපයේ ආරක්ෂාව සඳහා සිංහල කලාකරුවා විසින් නිර්මාණය කරන ලද ගෘහ විශේෂය හැඳින්වූයේ,
(1) අටදාගේ නමිනි. (2) හැටදාගේ නමිනි. (3) චෛත්‍යශාලා නමිනි.
(4) වටදාගේ නමිනි. (5) ගෙඩිගේ නමිනි.

49. ලක්දිව වංසකථා සාහිත්‍යයට අනුව මහින්දාගමනයෙන් පසු මෙරට ඉදි වූ ප්‍රථම ස්තූපය වන ථූපාරාමයෙහි නිදන් කොට ඇති ධාතුන් වහන්සේ වන්නේ,
(1) අකු ධාතුවයි. (2) පටී ධාතුවයි. (3) ලලාට ධාතුවයි.
(4) ග්‍රීවා ධාතුවයි. (5) පාත්‍රා ධාතුවයි.

50. බුදුරජාණන් වහන්සේගේ ගුණ තේමා කර ගනිමින් ගුරුළුගෝමීන් විසින් රචනා කරන ලද අමාවතුර ග්‍රන්ථයට තේමා වී ඇත්තේ,
(1) අරහං ගුණයයි. (2) සම්මා සම්බුද්ධ ගුණයයි.
(3) සුගත ගුණයයි. (4) පුරිසදම්ම සාරථී ගුණයයි.
(5) සත්ථා දේවමනුස්සානං ගුණයයි.

***

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

39357

AL/2017/45/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) බ්‍රාහ්මණ වර්ණයට නියම කර තිබූ ස්වධර්ම ගෙනහැර දක්වන්න.

(ii) යාගයක් අංග සම්පූර්ණ වීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා කෙටියෙන් දක්වන්න.

(iii) බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් ශුද්‍ර වර්ණයට අහිමි කළ කාර්ය **පහක්** සඳහන් කරන්න.

(iv) නිගණ්ඨනාතපුත්තතුමන්ගේ මූලික ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.

(v) බ්‍රාහ්මණ ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම පිණිස ශ්‍රමණ සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාධක ගෙනහැර දක්වන්න.

**2.** (i) බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව කාන්තාවට අහිමි වූ වරප්‍රසාද පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

(ii) ආධ්‍යාත්මික සංවර්ධනයෙහිලා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සනාථ කරන්න.

(iii) බුද්ධකාලීන කෝසල රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(iv) පවුල් සංස්ථාවේ ප්‍රභවය බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

(v) 'දස රාජධර්ම' නිවැරදිව නම් කරන්න.

**3.** (i) සතර අගතිය කෙටියෙන් හඳුන්වන්න.

(ii) සිගාලෝවාද සූත්‍රයට අනුව ස්වාමි භාර්යා යුතුකම් හා වගකීම් ලියා දක්වන්න.

(iii) හිරි ඔතප් නොසලකන සමාජයක දැකිය හැකි පරිහානීය ලක්ෂණ **පහක්** ගෙනහැර දක්වන්න.

(iv) 'වසලකරණ ධර්ම' **අටක්** නම් කරන්න.

(v) 'කල්‍යාණ මිත්තතාව' මූලාශ්‍රය ඇසුරෙන් පහදන්න.

## II කොටස

**4.** (i) සාවකසංඝ සමාජයේ ව්‍යුහය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

(ii) ආර්ය මාර්ගය වැඩීමට ආකාරවතී ශ්‍රද්ධාව උපයෝගී වන ආකාරය පරීක්ෂා කරන්න.

(iii) පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම පෙන්වා දෙන්න.

(iv) බුදුරජාණන් වහන්සේ ස්වභාව සෞන්දර්යය අත්විඳි ආකාරය පැහැදිලි කරන්න.

**5.** (i) 'පුරිසදම්ම සාරථී' බුදුගුණය උදාහරණ සහිතව විවරණය කරන්න.

(ii) ආදර්ශවත් නායකත්වයක් තුළ තිබිය යුතු මූලික ගුණාංග බුද්ධචරිතය ඇසුරින් ප්‍රකට කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනය සඳහා යොදා ගත් විවිධ ක්‍රමෝපායයන් ගෙනහැර දක්වන්න.

(iv) යථාර්ථාවබෝධය සඳහා විදර්ශනා භාවනාවෙහි උපයෝගිතාව පෙන්වා දෙන්න.

[ දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**6.** (i) නිදහස් චින්තනයට බුදුදහමෙන් ලැබෙන පිටිවහල ප්‍රකට කරන්න.

(ii) බෞද්ධ පබ්බජ්ජාවේ ආරම්භය හා විකාශය කෙටියෙන් දක්වන්න.

(iii) වස් විසීම හා ඊට අදාළ ආගමික චාරිත්‍ර විධි පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

(iv) භාරතයේ ප්‍රකට ව පැවති පැරණි බෞද්ධ විශ්වවිද්‍යාල නම් කොට 'වලභි' විශ්වවිද්‍යාලය පිළිබඳ ඇගයීමක් කරන්න.

**7.** (i) සම්බුද්ධ පරිනිර්වාණය වන විට ධර්ම සංගායනාවක අවශ්‍යතාව පැනනැගී තිබූ බවට සාක්ෂි ගෙනහැර දක්වන්න.

(ii) "ධර්ම සංගායනාවක අරමුණ වන්නේ ශාසන චිරස්ථිතියයි." දෙවන ධර්ම සංගායනාව ඇසුරින් සාකච්ඡා කරන්න.

(iii) 'වැවයි-දාගැබයි, ගමයි-පන්සලයි' යන සංකල්පයෙන් ඉපැරණි ශ්‍රී ලාංකේය සමාජයේ ලෞකික හා ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රකට වූ අයුරු පෙන්වා දෙන්න.

(iv) 'සෙන්' බුදු දහමෙන් ජපන් සංස්කෘතියට ලැබුණු ආලෝකය ප්‍රමාණ කරන්න.

**8.** (i) ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස බුදුසමයෙන් හැඩගැසුණු ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳව පවත්නා මතවාද කෙටියෙන් දක්වා, ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල සම විෂමතා පෙන්වා දෙන්න.

(iii) "පටිමාඝරය පැරණි ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පයෙහි විශිෂ්ටත්වය ප්‍රකට කරන්නකි." තහවුරු කරන්න.

(iv) ශ්‍රී ලාංකේය වංශකථා සාහිත්‍ය බිහිවීමෙහිලා බෞද්ධ පූජනීය වස්තු විෂය වූ ආකාරය උදාහරණ මගින් ප්‍රකට කරන්න.

* * *

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk